ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාව
**SRI LANKA COUNCIL OF ARCHAEOLOGISTS**
**(1992 අංක 04 දරණ පාර්ලිමේන්තු පනතින් නීති ගත කර ඇත, Incorporated Under Act No. 04 of 1992)**
**පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ 07 Department of Archaeology, Colombo 07 SLCA**

දිනය /Date: 2026.02.20

……………………………………………
ගරුතර ස්වාමීන්වහන්ස/මහත්මයාණෙනි/මහත්මියනි/මෙනෙවියනි,

**ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ මහ සභා රැස්වීම පැවැත්වීම, ප්‍රගති සමාලෝචනය හා 2026/2027 වර්ෂය සඳහා නව පාලක සභාව පත්කර ගැනීම**

ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ 2025.12.17 දින පැවති පාලක සභා රැස්වීමේ දී යෝජනාකොට ස්ථිර කරගත් පරිදි, 2026/2027 වර්ෂය සඳහා මහා සභා රැස්වීම එළඹෙන මාර්තු මස පැවැත් වේ.

02. ඒ අනුව ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ 32 වන මහා සභා රැස්වීම 2026 මාර්තු මස 26 වන බ්‍රහස්පතින්දා පෙ.ව. 09.30 ට කොළඹ 07, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, පිහිටි ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තු ශ්‍රවණාගාරයේ දී පැවැත්විමට කටයුතු සංවිධානය කර ඇත.

03. මෙම මහාසභා රැස්විමේ දී ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාව විසින් පසුගිය කාලසීමාව තුළ සිදුකරන ලද ක්‍රියාකාරකම් පිළිබඳව සමාලෝචනයක් ඉදිරිපත් කිරිමට නියමිත ය.

04 ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ 1992 අංක 04 දරණ (සංස්ථාගත) පනත ප්‍රකාරව දැනට පවත්නා පාලක සභාවේ නිල කාලය 2026/03/26 යන දිනෙන් අවසන් වන බැවින්, 2026/2027 වර්ෂය සඳහා අලුතින් පාලක සභාව පත්කර ගැනීම ද එදිනට සැලසුම්කර ඇත. එම කාරක සභික තනතුරු සඳහා ඔබට ද ඉල්ලුම් කළ හැකි ය.

05 ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ පනත ප්‍රකාරව, ජ්‍යෙෂ්ඨ උප සභාපති හා උප සභාපති ධූරය යන තනතුරු දැරිය හැක්කේ අඛණ්ඩව වසර දෙකක් පමණක් වන බැවින් එකී කාලය ඉකුත්වීම නිසා ජ්‍යෙෂ්ඨ උප සභාපති ධූරය ද, උප සභාපති ධූරය ද, එක් සම ලේකම් ධූරයක් ද පුරප්පාඩු වන බැවින් එම තනතුරු සඳහා මෙම වසරේ නිලධාරීන් පත්කර ගත යුතු වේ.

| | | |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨ උප සභාපති ධූරය | 01 | යටත් පිරිසෙන් ධූරකාල දෙකක් වත් පාලක සභාවේ සේවය කර ඇති අධි සාමාජියෙකු විය යුතුය |
| උප සභාපති ධූරය | 01 | යටත් පිරිසෙන් ධූරකාල දෙකක් වත් පාලක සභාවේ සේවය කර ඇති අධි සාමාජියෙකු විය යුතුය |
| සම ලේකම් ධූරය | 01 | යටත් පිරිසෙන් ධූරකාල දෙකක් වත් පාලක සභාවේ සේවය කර ඇති සංස්ථාගත සාමාජියෙකු විය යුතුය |

06. කාරක සභික තනතුරු 11 කි. එහි සංයුතිය පහත සඳහන් පරිදි වේ.

| | | |
|---|---|---|
| (අ) සංස්ථාගත සාමාජිකයින් | 08 යි. | මෙම සාමාජික කාණ්ඩය අධි සාමාජික, සාමාජික හා සහාය සාමාජිකයන්ගෙන් සමන්විත වන අතර එය යටත් පිරිසයින් සහය සාමාජිකයන් දෙදෙනෙකු (02) ගෙන් සමන්විත විය යුතු ය. |
| (ආ) ලියාපදිංචි සාමාජිකයින්<br>(ඇ) ශිෂ්‍ය සාමාජිකයින් | | අවම වශයෙන් එක් (01) ලියාපදිංචි සාමාජිකයෙකු හා එක් (01) ශිෂ්‍ය සාමාජිකයෙකු ඇතුළත් වන පරිදි සාමාජිකයන් තිදෙනෙකු (03) ගෙන් සමන්විත විය යුතු ය. |

යථෝක්ථ (අ,ආ,ඇ) එක් එක් තනතුරක් සඳහා වෙන වෙන ම අයදුම්පත මගින් ඉලල්ම් කළ යුතු ය. එම අයදුම්පත් 2026 මාර්තු මස 13 වන දින ප.ව. 04.00 ට පෙර ලැබෙන සේ **සමලේකම්, ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාව, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනැවිත් භාරදිය යුතු ය. ඊට අදාළ අයදුම්පත slca.gov.lk වෙබ් අඩවියේ සහ ශ්‍රී ලංකා පුරාද්‍යාඥයන්ගේ සභාවේ නිල මුහුණු පොතෙන් (Sri Lanka Council of Archaeologists) මගින් බාගත හැකි ය. තනතුරු සඳහා ඉල්ලුම් කිරීමේ දී ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරෙහි **ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ පාලක මණ්ඩලයේ ඔබ විසින් ඉල්ලුම් කරන තනතුර** සඳහන් කළ යුතු ය. මෙම සෑම තනතුරක් සඳහා ම අයදුම්කරුවන්ගේ කැමැත්ත ප්‍රකාශ වී තිබිය යුතු අතර, ඉහත අංක 01 සිට 06 දක්වා තනතුරු සඳහා සංස්ථාගත සාමාජිකයන් දෙදෙනෙක් ද, ඉහත අංක 06 (ආ) තනතුර සඳහා ලියාපදිංචි සාමාජිකයින් දෙදෙනෙකුගෙන් ද ඉහත අංක 06 (ඇ) තනතුර සඳහා ශිෂ්‍ය සාමාජිකයින් දෙදෙනෙකුගෙන් ද, යෝජනා ස්ථිර කරමින් නාම යෝජනා ඉදිරිපත් කළ යුතු ය. **2026.03.13 දින** ප.ව. **04.00** න් **පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප** කරනු ලැබේ.

මෙම තනතුර සඳහා ඉල්ලුම් කරන සාමාජික භවතුන් සහ යෝජනා ස්ථිර කරනු ලබන්නන් නියමිත පරිදි **2026.03.13** දින වන විට **2025** වර්ෂය සඳහා සහ ඊට පෙර වර්ෂවල වාර්ෂික සාමාජික මුදල් ගෙවා අවසන් කොට තිබිය යුතු ය.

මෙම මුදල **2026.03.20** දින හෝ එදිනට පෙර ලංකා බැංකුවේ නිදහස් චතුරශ්‍ර ශාඛාවේ 0006089718 අංක දරණ ගිණුම් අංකයට බැර කොට, ලදුපතෙහි පිටපතක් **සමලේකම් ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාව, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නැතහොත් එදිනට පෙර පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ කාර්යාලයට ගෙවා ලදුපතක් ලබාගත යුතු ය. බැංකුගත කළ මුදල්වලට අදාළ ලදුපතෙහි ඔබගේ නම, ඔබ දැනට දරණ සාමාජිකත්වය හා සාමාජික අංකය ද සඳහන් කරමින් ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයින්ගේ සභාවේ සමලේකම් වෙත ඉහත ලිපිනයට එවිය යුතු වේ. **අදාළ ලේඛනවල ඔබ විසින් මුදල් ගෙවූ බවට සටහන් තබනු ලබන්නේ ඔබ විසින් බැංකුවට මුදල් ගෙවූ ලදුපතෙහි පිටපත අප වෙත ලැබීමෙන් පසු පමණි.** එසේ නොවන්නේ නම් ඔබ බැංකුවට මුදල් ගෙවා ඇතත් මුදල් නොගෙවූ අයෙකු සේ සැලකේ.

**(සැලකිය යුතුයි- ඔබ ලංකා බැංකුවට මුදල් බැරකරන විට බැංකු ලදුපතෙහි ඔබගේ නම සහ සාමාජික අංකය සඳහන් කිරීමට කාරුණික වන්න.)**

සාමාජික මුදල් නොගෙවීමෙන් ඔබගේ සාමාජිකත්වය අහෝසි වන අතර, එසේ සාමාජිකත්වය අහෝසි වුවහොත් නැවත නව සාමාජිකයෙකු ලෙස සාමාජිකත්වය සඳහා අයදුම් කළ යුතු ය. එසේ වුවහොත් සංස්ථාගත සාමාජිකත්වය ඇති අයට "පුරාවිද්‍යාඥ" යන අභිධානය භාවිත කිරීමත්, පුරාවිද්‍යා ආඥා පනතින් හා ගැසට් නිවේදන මගින් ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ සංස්ථාගත සාමාජිකයන්ට පවරා ඇති කාර්යයන්ට අයදුම් කිරීමත්, භාර ගැනීමත්, එම කටයුතු සංස්ථාගත නොවන සාමාජිකයන්ට පැවරීමත්, ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ පනත උල්ලංඝනය කිරීමක් වේ.

7. මහ සභාවට ඉදිරිපත් කළ යුතු නව යෝජනා හා අදහස් ඇතොත්, **2026.03.20** වන දින පෙර ඉහත ලිපිනයට ලිඛිත ව දන්වා එවන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමු.
   මෙදින සහභාගී වන සියළු සාමාජිකයන් ස්වකීය වෘත්තීයභාවයට ගැලපෙන පරිදි සුදුසු ඇඳුමකින් සැරසී පැමිණිය යුතු ය.
   මහාසභා රැස්වීමට ඔබගේ සහභාගීවීම පිළිබඳව පහත සඳහන් දුරකථන අංකයන්ට කෙටි පණිවිඩයක් එවීමට කාරුණික වන්න.
   සමලේකම් පුරාවිද්‍යාඥ සුජාතා පෙරේරා මිය - 071 806 6490
   සමලේකම් පුරාවිද්‍යාඥ කලණ මාරසිංහ මහතා - 074 285 7965

මෙදින මහ සභාවට සහභාගී වන සියලු සාමාජික භවතුන් වෙත දිවා ආහාරය සපයනු ලැබේ.

ගරු සමලේකම්
පුරාවිද්‍යාඥ සුජාතා පෙරේරා

ගරු සමලේකම්
පුරාවිද්‍යාඥ එම්.ඩී. කලණ මාරසිංහ

ගරු සභාපති
පුරාවිද්‍යාඥ ආචාර්ය ඩබ්. බෝහිංගමුව

(*සැ.යු:* ඔබ කාර්යාලයට සාමාජික මුදල් ගෙවීම් කටයුතු කරන්නේ නම් සතියේ සඳුදා දින පැමිණෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.)

**2026 මාර්තු මස 26 වන දින පෙ.ව. 9.30 ට ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තු ශ්‍රවණාගාරයේ දී පවත්වනු ලබන ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ 32 වන වාර්ෂික මහාසභා රැස්වීමේ න්‍යාය පත්‍රය**

| | |
|---|---|
| පෙ.ව. 9. 15 | සභාවේ අසුන් ගැනීම |
| පෙ.ව. 9.25 | ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ වාර්ෂික මහා සභා රැස්වීම නිවේදනය කිරීම<br>ගරු සමලේකම් පුරාවිද්‍යාඥ කලණ මාරසිංහ මහතා |
| පෙ.ව. 9.30 | පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ නිලධාරී මණ්ඩලය සහා සම්ප්‍රාප්තිය |
| පෙ.ව. 9.35 | සම්ප්‍රදායික පොල්තෙල් පහන දැල්වීම |
| පෙ.ව. 9.45 | ආගමික වතාවත් ඉටුකිරීම - පුරාවිද්‍යාඥ පූජ්‍ය රන්නේ සීලවිමල හිමි |
| පෙ.ව. 9.50 | මුලාසනය පිළිගැන්වීම |
| **පෙ.ව. 9.55** | සභාව නියෝජනය කරමින් සිට අභාවයට පත් වූ සාමාජිකයන් සිහිපත් කිරීම සඳහා<br>විනාඩියක නිශ්ශබ්දතාවක් පැවැත්වීම |
| පෙ.ව. 10.00 | පිළිගැනීමේ කතාව<br>ගරු ජ්‍යෙෂ්ඨ උපසභාපති පුරාවිද්‍යාඥ මහාචාර්ය ආර්.එම්.එම්. චන්ද්‍රරත්න මහතා |
| පෙ.ව. 10.10 | ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ සාමාජිකයෙකුව සිට පුරාවිද්‍යා ක්ෂේත්‍රය වෙනුවෙන් කරන ලද<br>විශිෂ්ට සේවාව ඇගයීමේ සම්මාන ප්‍රදානය |
| පෙ.ව. 10.50 | 2025 මාර්තු මස 28 වන දින ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තු ශ්‍රවණාගාරයේ දී පවත්වනු ලැබූ මහා<br>සභාවේ වාර්තාව සභාවට ඉදිරිපත් කිරීම - ගරු සමලේකම් පුරාවිද්‍යාඥ එම්.ඩී. කලණ මාරසිංහ මහතා |
| පෙ.ව. 11.00 | 2025 මාර්තු මස 28 වන දින ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තු ශ්‍රවණාගාරයේ දී<br>ඉකුත් මහා සභා වාර්තාවෙන් පැනනැගුණු කරුණු සාකච්ඡා කිරීම සහ සභා සම්මතකර ගැනීම<br>මෙහෙයවීම - ගරු සභාපති පුරාවිද්‍යාඥ ආචාර්ය විජේරත්න බෝහිංගමුව මහතා |
| පෙ.ව. 11.30 | ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ 2025/2026 වාර්ෂික වාර්තාව සභාවට ඉදිරිපත් කිරීම<br>ගරු සමලේකම් පුරාවිද්‍යාඥ සුජාතා පෙරේරා මිය |
| පෙ.ව. 11.45 | ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ 2025/2026 වාර්ෂික වාර්තාවෙන් පැනනගින කරුණු සාකච්ඡා කිරීම<br>සහ සභා සම්මතකර ගැනීම<br>මෙහෙයවීම - ගරු සභාපති පුරාවිද්‍යාඥ ආචාර්ය විජේරත්න බෝහිංගමුව මහතා |
| ප. ව. 12.00 | ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ 2025/2026 වර්ෂයට අදාළ වාර්ෂික ගිණුම් වාර්තාව සභාවට ඉදිරිපත්<br>කිරීම - ගරු භාණ්ඩාගාරික පුරාවිද්‍යාඥ සුරංග ගුණවර්ධන මහතා<br>වාර්ෂික ගිණුම් වාර්තාවෙන් පැනනගින කරුණු සාකච්ඡා කිරීම සහ වාර්ෂික ගිණුම් වාර්තාව සභා සම්මත<br>කර ගැනීම - මෙහෙයවීම - ගරු සභාපති පුරාවිද්‍යාඥ ආචාර්ය විජේරත්න බෝහිංගමුව මහතා |
| ප. ව. 12.10 | අදහස්, යෝජනා හා සාකච්ඡා වාරය -<br>මෙහෙයවීම - ගරු සභාපති පුරාවිද්‍යාඥ ආචාර්ය ආචාර්ය විජේරත්න බෝහිංගමුව මහතා |
| ප. ව. 01.00 | නව නිලධාරී මණ්ඩලය පත් කර ගැනීම - මෙහෙයවීම<br>ගරු ජ්‍යෙෂ්ඨ උප සභාපති පුරාවිද්‍යාඥ මහාචාර්ය ආර්.එම්.එම්. චන්ද්‍රරත්න මහතා |
| ප.ව. 01.10 | ගරු සභාපති ධූරයෙන් ඉවත් වන පුරාවිද්‍යාඥ ආචාර්ය ඩබ්. බෝහිංගමුව මහතා විසින් ගරු සභාව<br>ඇමතීම |
| ප.ව. 01. 20 | 2026/2027 වර්ෂයේ සිට අභිනව ගරු සභාපති පුරාවිද්‍යාඥ මහාචාර්ය ආර්.එම්.එම්.චන්ද්‍රරත්න මහතා වෙත<br>සභාපති ලෝගුව පැළඳවීම - ආසන්න පූර්ව සභාපති ආචාර්ය විජේරත්න බෝහිංගමුව මහතා |
| ප. ව. 01.30 | නව සාමාජිකයන් සඳහා සහතික පත්‍ර ප්‍රදානය - මෙහෙයවීම සාමාජික අනුකමිටුවේ<br>සභාපති පුරාවිද්‍යාඥ සුජාතා පෙරේරා මහත්මිය |
| ප. ව. 01.30 | නව නිලධාරී මණ්ඩලය කටයුතු ඇරඹීම |
| ප. ව. 01.35 | ගරු සභාපතිතුමා සභාව ඇමතීම |
| ප. ව. 01.45 | ස්තුති කතාව - ගරු සමලේකම් පුරාවිද්‍යාඥ එම්.ඩී. කලණ මාරසිංහ මහතා |
| ප. ව. 01.50 | ජාතික ගීය වාදනය කිරීම සහ සභාවේ කටයුතු නිමාව |
| ප. ව. 02.00 | දිවා ආහාරය |